ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2012 ඔක්තෝබර් මස 23 වැනි දින |

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 ඔක්තෝබර්**

පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි ප්‍රසාරණය සීමාකිරීමට මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි ඵලදායී බව නොකඩවාම සනාථ කරමින් පෞද්ගලික අංශය වෙත වූ සමස්ත ණය ප්‍රමාණයෙහි වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2011 මාර්තු මාසයේ සිට ප්‍රථම වතාවට සියයට 30 කට වඩා අඩු වෙමින්, අගෝස්තු මාසයේ දී සියයට 28.7 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. නිරපේක්ෂ පදනම අනුව 2012 පළමු කාර්තුවේ දී පැවති සාමාන්‍ය මාසික වර්ධනය වූ රුපියල් බිලියන 51.8 ට සාපේක්ෂව, පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය අගෝස්තු මාසයේ දී රුපියල් බිලියන 14 ක් විය. පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි අඩුවීම හමුවේ වුවද රාජ්‍ය අංශයේ ණය ගැනීම් ඉහළ යාම හේතුවෙන් අගෝස්තු මාසයේ දී පුළුල් මුදල්හි වර්ධනය පෙර මාසයට වඩා වැඩි විය.

වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය අඛණ්ඩව දෙමසක් තුළ අඩුවෙමින් සැප්තැම්බර් මාසයේ දී සියයට 9.1 ක් විය. මෑතකදී පරිපාලිත මිල ගණන්වලට සිදුකරන ලද සංශෝධනයන් සහ ගෝලීය සැපයුම් තත්ත්වයන්හි අවිනිශ්චිත බව තවදුරටත් ඉහළ මට්ටමක පැවතීම තුළින් කෙටිකාලීනව උද්ධමනය මත පීඩනයක් ඇතිවෙමින් පවතින අතර දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් අනාගත උද්ධමනයට සැපයුම් අංශයේ සාධකයන්ගෙන් ඇති වන දෙවන වටයේ බලපෑම වළක්වා ගැනීමට මෙන්ම එමගින් මධ්‍යකාලීනව උද්ධමනය මැදි තනි අංකයක මට්ටමේ පවත්වා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතර, ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම තවදුරටත් මන්දගාමීව සිදුවූ නමුත් ෆෙඩරල් සංචිත බැංකුව මගින් මෑතක දී ක්‍රියාත්මක කරන උත්තේජන ක්‍රියාමාර්ග ආධාර කොටගෙන ඇමෙරිකා එක්සත් ජනපද ආර්ථිකයේ යම් හිතකර තත්ත්වයක සලකුණු පෙන්නුම් කරයි. තවද, යුරෝ කලාපය තුළ දිගුකාලීනව පවතින ආර්ථික අවපාතය හේතුවෙන් ඔවුන්ගේ ආනයන ඉල්ලුම අඩුවනු ඇත. තුන්වෙනි කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය සියයට 7.4 ක් ලෙස පුරෝකථනය කිරීමත් සමගම චීන ආර්ථිකයෙහි ද යම් මන්දගාමීබවක සලකුණු පෙන්නුම් කෙරේ. ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම සම්බන්ධයෙන් පවතින මෙවැනි මන්දගාමී තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් එහි ගෝලීය වර්ධනය සඳහා වන පෙරදැක්ම 2012 දී සියයට 3.3 ට සහ 2013 සඳහා සියයට 3.6 ක් ලෙස සංශෝධනය කරන ලදී. මෙලෙස ගෝලීය ආර්ථිකය තවදුරටත් මන්දගාමී වීම විදේශ ඉල්ලුම මත ප්‍රධාන වශයෙන්ම රඳාපවතින, නැගී එන වෙළෙඳපොළ සහ දියුණුවෙමින් පවතින ආර්ථිකයන් මත අහිතකර බලපෑමක් ඇතිකරනු ඇත.

මෙවැනි ප්‍රවණතා පිළිබිඹු කරමින්, පසුගිය මාස හය තුළ දී ශ්‍රී ලංකාවේ අපනයන ද අඩු වූ නමුත් 2012 මුල දී හඳුන්වාදුන් ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵලයක් ලෙස ආනයන සැලකිය යුතු ලෙස අඩු විය. වෙළෙඳ ශේෂයේ ඇති වූ හිතකර බලපෑම සහ අනෙකුත් විදේශ ලැබීම් ප්‍රවාහ හේතුකොට ගෙන අගෝස්තු වන විට ගෙවුම් තුලනයෙහි එ.ජ.ඩොලර් මිලියන 305.9 ක අතිරික්තයක් වාර්තා වූ අතර ආනයනික මාස 4.3 කට පමණ සමාන වන ලෙස දළ නිල සංචිතය වර්තමාන මට්ටම වන එ.ජ.ඩොලර් බිලියන 7 දක්වා ඉහළ නංවා ගැනීමට එය උපකාරී විය.

ඉහත සඳහන් කරන ලද වර්ධනයන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි මතය අනුව දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය උචිත වන බැවින් 2012 ඔක්තෝබර් 22 වැනි දින පැවති එහි රැස්වීමේ දී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේම නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.75 සහ සියයට 9.75 ක් ලෙස පවතිනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය සිදුකරනු ලබන දිනය යථාකාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.